# සූතිකා උන්මාදය විවරණය කිරීමේ දී නීලම්මහර පාරම්පරික උන්මාද රෝග චිකිත්සකයාගේ විද්‍යාත්මක ක්‍රමවේදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ලියනගේ ආර්. පී.[1], හෙට්ටිගේ එස්. එස්.[2], කරුණාරත්න එච්. කේ. බී. එම්. එස්.[3]
[1]ආනියාකන්ද ආයුර්වේද රෝහල, කඳාන.
[2]මනස ආයුර්වේද මානසික රෝහල, නීලම්මහර, බොරලැස්ගමුව.
[3]චිකිත්සා අධ්‍යයනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

## සංක්ෂිප්තය

කාශ්‍යප සංහිතාවේ දුෂ්ප්‍රජාත චිකිත්සිත අධ්‍යාය හා සූතිකෝපක්‍රමණීය අධ්‍යායට අනුව සූතිකා රෝග සංඛ්‍යාත්මක ව 74කි. ඒ අනුව කාශ්‍යප සංහිතාවෙහි නාම මාත්‍රික ව පමණක් සඳහන් වන සූතිකා උන්මාද රෝගය පිළිබඳ රෝග විනිශ්චයට හේතු වන විවරණයක් කිසිදු ආයුර්වේද හෝ දේශීය චිකිත්සා මූල ග්‍රන්ථයක සඳහන් නොවේ. එසේ ම සූතිකා උන්මාදය පිළිබඳ දෝෂ තත්ත්වයන්, ලක්ෂණ, සාධ්‍ය-අසාධ්‍යතා ආදිය කිසිවක් පිළිබඳ නිශ්චිත ලිඛිත සාක්ෂියක් ආයුර්වේදෝක්ත ව හෝ දේශීය චිකිත්සෝක්ත ව නොමැති වීමෙන් වෛද්‍යවරු සමාජයේ සුලභ ව හමුවන මේ රෝග තත්ත්වය සූතිකා උමතුව ලෙස නිශ්චිත වැටහීමකින් තොර ව කටයුතු කරයි. නීලම්මහර උන්මාද චිකිත්සිතයන් සිය පාරම්පරික දැනුම මුඛ පරම්පරාගත ව සහ තල්පත් හෝ පුස්කොළ පත් ආශ්‍රිත ව ග්‍රන්ථාරූඪ කරගෙන පැමිණ ඇති හෙයින් එය විමසා බලන විට දී සූතිකා උන්මාදය පිළිබඳ ව ඉතා වැදගත් අර්ථ නිරූපණයක් කාව්‍ය භාෂිත ව පවතී. එම සාහිත්‍යාගත තොරතුරු ආයුර්වේද විකෘති විඥානීය ක්‍රමවේදය ඔස්සේ මෙහි දී අධ්‍යයනය කර ඇත. මේ අනුව නිදාන සම්ප්‍රාප්ති සාධක ලෙස අපරාපතනයෙන් පසු ව නියමාකාර ව ගර්භාෂය පිරිසිදු නොවූ සූතිකාවන්ගේ ගර්භගත දූෂිත රක්ත පදාර්ථ නිසා ශාරීරික දෝෂ කෝප වී ඌර්ධ්වගාමී වී උමතු රෝග ඇති වෙයි. මොවුන්ගේ ප්‍රධාන පූර්වරූප හා රූප ලක්ෂණ ලෙස තීව්‍ර ජ්වර තත්ත්ව පැවතීම, ප්‍රලාප, කලබලකාරී හැසිරීම, රක්ත වර්ණ වූ නෙත් යුග හා දත්කූරු සැපීම දක්වයි. දෝෂ ප්‍රාගුණ්‍යතාව සලකා රෝගය ප්‍රභේද 07ක් යටතේ කේවල දෝෂජ, ද්විදෝෂජ හා ත්‍රිදෝෂජ ලෙස වර්ග කරයි. එම ප්‍රභේද පිළිබඳ සාධ්‍යාසාධ්‍යතාව සලකා වියරු, රුදුරු, භියකරු හා අනතුරු ලෙස යාප්‍ය, සාධ්‍ය, කෘච්ඡ්‍රසාධ්‍ය හා අසාධ්‍ය අවස්ථා පැහැදිලි කරයි. නීලම්මහර සූතිකා උමතු විවරණය මේ ආකාරයට අර්ථ නිරූපණය කිරීමේ දී පැවසෙන රෝග ලක්ෂණ බොහොමයක් නව්‍ය බටහිර මතානුකූල පෝස්ට් නේටල් සයිකෝසිස් රෝග ලක්ෂණවලට සමපාත වේ. එසේ ම රෝග සම්ප්‍රාප්ති සාධක විමසීමේ දී පෙර ආයුර්වේදෝක්ත සූතිකා රෝග සම්ප්‍රාප්තියට බොහෝ සමානකම් දක්වයි. සූතිකා උමතුව ආයුර්වේදාගත දෝෂ ප්‍රාගුණ්‍යය මත පදනම් වී වර්ගීකරණය කිරීමට හැකි බව දක්වේ. එහි වැදගත්ම ප්‍රතිඵලය වන්නේ චිකිත්සාවේ දී දෝෂ ප්‍රමුඛතා වටහා ගෙන චිකිත්සාව ගොඩනැංවීමට හැකි වීම යි. පාරම්පරික නීලම්මහර දේශීය චිකිත්සකයා සිය විකෘති විඥානීය දැනුම සූතිකා උන්මාද රෝග විවරණයේ දී සාර්ථක ව මෙහෙයවා ඇති ආකාරය අධ්‍යයනයේ දී මැනවින් පිළිබිඹු විය.

**ප්‍රමුඛ පදඃ** සූතිකා උන්මාදය, නීලම්මහර, දේශීය චිකිත්සා, විකෘති විඥාන

**විද්‍යුත් ලිපිනයඃ** liyanr20@gmail.com